**තේ ශක්ති අරමුදල - 2020**

**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාචනය කළ මතය

තේ ශක්ති අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ,2000 අංක 47 දරන තේ ශක්ති අරමුදල් පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

### 1.2 ව්‍යාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය.

මෙම කරුණු හේතුවෙන්, වාර්තා කළ හෝ වාර්තා නොකළ මුදල් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සම්බන්ධයෙන් කිසියම් ගැළපීමක් අවශ්‍ය වී ඇත්දැයි මට තීරණය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තේ ශක්ති අරමුදල වෙත 1998 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වා භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ රු.437,505,030 ක් වූ ප්‍රාග්ධන ප්‍රදානය, ප්‍රාග්ධන වත්කම් හෝ මෙහෙයුම් වියදම් සඳහා උපයෝජනය කළ ආකාරය හඳුනා ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැති වීම මත 2012 වර්ෂයේ සිට වසර 10 කින් ක්‍රමක්ෂය කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර ප්‍රදාන මත මිලදීගත්/ඉදි කළ හෝ නවීකරණය කළ වත්කම්වල වටිනාකම පිළිබඳ තහවුරුවක් නොවූ බැවින් සමාලෝචිත වර්ෂයේ විලම්බිත ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණු රු.43,750,503 ක් වූ ක්‍රමක්ෂය වටිනාකමෙහි නිවැරදිතාවය පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු නොවුණි. | එකඟවෙමි.<br>තේ ශක්ති අරමුදලේ වත්කම් මිලදී ගැනීම් හා ඉදිකිරීම් කටයුතු 2000, 2001 හා 2002 වර්ෂවල සිදු කර ඇති අතර, මහාභාණ්ඩාගාරය මඟින් ලබාදී ඇති රුපියල් මිලියන 437.50 ප්‍රතිපාදන කුමන වත්කම මිලදී ගැනීමට / ඉදි කිරීමට හෝ නවීකරණය කිරීමට භාවිතා කළේද යන්න පිළිබඳ වාර්තා මේ වනවිට තේ ශක්ති අරමුදල සතුව නොමැත. | භාණ්ඩාගාර ප්‍රදාන ස්ථාවර වත්කම් සහ මෙහෙයුම් වියදම් සඳහා උපයෝගී වූ ආකාරය පිළිබඳව නිශ්චිතව හඳුනාගත යුතු අතර එම උපයෝජනයන් පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 හි 97 ඡේදය හා මූල්‍ය ප්‍රකාශ සඳහා වූ ගිණුම්කරණ සටහන් අංක 2.5 ප්‍රකාරව පරිගණක මෘදුකාංග වර්ෂ 5ක් තුළ ක්ෂය කල යුතු වුවද 2010 වර්ෂයේදී රු.2,600,000 කට මිලදීගෙන ස්ථාපිත කර තිබූ පරිසනක මෘදුකාංගය 2020 දෙසැම්බර් 31 දක්වාම ක්‍රමක්ෂය නොකර පිරිවැයට ඉදිරිපත් කර තිබුණි. | එකඟවෙමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ක්‍රමක්ෂය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008/2009 තක්සේරු වර්ෂයේදී ගෙවූ රු. 2,790,822 ක ආර්ථික සේවා ගාස්තු , ආදායම් බද්දට හිලව් කරගත හැකි කාලපරිච්ඡේදය වූ වර්ෂ 03ක කාලය ඉක්මවා තිබුණද ලියාහැරීමට කටයුතු නොකර ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එකඟවෙමි.<br>2025 අවසාන ගිණුම් වාර්තා මගින් අදාල මුදල කපා හැරීමට කටයුතු කරන බැව් දන්වා සිටිමි. | විධිමත් අනුමැතිය යටතේ පොත්වලින් ලියා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අරමුදලේ වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක්, විස්තරාත්මක උපලේඛන, 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා හෝ කිසිදු විස්තරාත්මක තොරතුරක් අරමුදල සතුව නොපැවති බැවින් හා වෙනත් විකල්ප ක්‍රමවලින් තහවුරු කර ගැනීමට නොහැකි වීම මත 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි දැක්වෙන රු.226,565,308 ක් වටිනා දේපල,පිරියත හා උපකරණ සහ රු. 25,585,245 ක් වූ ආයෝජන දේපලද එම වත්කම් වලට අදාළ රු. 12,612,507 ක් වූ සමාලෝචිත වර්ෂයේ ක්ෂය කිරීම් වල සම්පූර්ණත්වය, නිවැරදිභාවය හා භෞතික පැවැත්ම සම්බන්ධයෙන් විගණනයට තහවුරු කරගත නොහැකි විය. | එකඟවෙමි.<br>2025 මූල්‍ය ප්‍රකාශන සමඟ ස්ථාවර වත්කම් ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතුය. |
| (ඇ) | පස්සර සහ කැප්පෙටිපොල තේ කර්මාන්තශාලාවලට අදාළ වාර්ෂික බදු ආදායම ගිවිසුම් ප්‍රකාරව නිවැරදිව හඳුනා නොගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ බදු ආදායම රු.2,463,750 කින් අධිගණනය වී තිබුණි. | එකඟවෙමි | ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්වීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | බදු දී තිබූ රයිගම් කෝරලය තේ කර්මාන්තශාලාවේ බදු ගිවිසුම අනුව කම්හලේ නිෂ්පාදිත නිමි තේ කිලෝවක් සඳහා රු.8 බැගින් තේ කිලෝ ප්‍රමාණය මත බදු ගෙවිය යුතු වූ අතර එය රු.250,000 ට අඩු නොවිය යුතු ලෙස සඳහන් වුවද අරමුදල විසින් බදු ගිවිසුම | එකඟවෙමි | ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව අයවිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ පෙන්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාරව රයිගම් කෝරලය තේ කර්මන්තශාලාවේ සමාලෝචිත වර්ෂයට අදාළව කිසිදු බදු ආදායමක් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි. | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂාවසානයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් ශේෂයන් හා ඊට අනුරූපී ශේෂ පිරික්සුමේ සහ අදාළ ලෙජර ගිණුමේ ශේෂයන් අතර වෙනස්කම් නිරීක්ෂණය විය. ඒ අනුව වර්ෂාවසානයට අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල රඳවාගත් ඉපයුම් ශේෂය රු.55,504,407 ක් වුවද ශේෂ පිරික්සුම අනුව එම ශේෂය රු. 57,306,167ක් හා ලෙජර් ගිණුමේ එම ශේෂය රු.43,648,595 ක් වී තිබුණි. තවද මූල්‍ය ප්‍රකාශන හා ශේෂ පිරික්සුම අනුව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වගකීම් ශේෂය රු.1,714,336 ක් වුවද අදාළ ලෙජර් ගිණුමෙහි වර්ෂාවසානයට ශේෂයක් දක්වා නොතිබුණි. එම වෙනස්කම් සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොවුණු අතර මූල්‍ය ප්‍රකාශන තුළින් ඉදිරිපත් කරන ලද ගිණුම් ශේෂයන්ගේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු නොවුණි. | එකඟවෙමි | ගිණුම් වර්ෂය අවසන් දින දක්වා යාවත්කාලීන කරන ලද ලෙජර ගිණුම් ශේෂයන් මත මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2019 වර්ෂයේ ජුනි 14 දිනට ශේෂය රු. 2,171,869 ක් වූ බැංකු ජංගම ගිණුම් 8ක් වසා දමා අරමුදල සතුව පැවති වෙනත් ජංගම ගිණුමක් වෙත මාරු කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම ශේෂයන් මුදල් සහ මුදල් සමාන දෑ වශයෙන් හා ජංගම වගකීමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන තිබුණි. | එකඟවෙමි | ගනුදෙනු නිවැරදි ලෙජර් ගිණුම් තුළින් ගැලපීමට කටයුතු කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ | 358,138,297 | විස්තරාත්මක උප ලේඛන හා ශේෂ සනාථ කිරීම් | ගිණුම් ශේෂය සම්බන්ධව තේ ශක්ති අරමුදල සම්බන්ධ නිර්දේශ ඉදිරිපත් කිරීමට පත්කල කමිටුවේ නිර්දේශ ලබා ගෙන 2025 අවසාන ගිණුම් වාර්තා මගින් අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කරන බැව් දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති ගිණුම් ශේෂ තහවුරු කරන ප්‍රමාණවත් විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම්, තක්සේරු වාර්තා , කළ වැඩ වටිනාකම් සහතික මූල්‍ය ප්‍රකාශන සමග විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ | 234,493,519 | | | |
| (ඇ) | පරිණත වූ තේ වගාව | 10,002,019 | තක්සේරු වාර්තා | | |
| (ඈ) | පරිණත නොවූ තේවගාව | 6,716,358 | | | |
| (ඉ) | කෙරීගෙන යන වැඩ | 1,567,205 | කළ වැඩ වටිනාකම් සහතික | | |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 චක්‍රලේඛය සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2021 සිට 2024 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුනේද 2025 නොවැම්බර් 10 දින වන අතර 2026 පෙබරවාරි 28 වන විටත් 2020 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | එකඟවෙමි | නියමිත කාල සීමාවන් තුළ මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 110,518,076 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 65,074,453 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු 45,443,623ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම් රු. 10,918,575 කින් වැඩි වීම, වෙනත් ආදායම් රු.9, 868,221 කින් වැඩිවීම, පොළී ආදායම් රු. 6,504,626 කින් වැඩි වීම සහ පරිපාලන වියදම් රු. 18,151,791 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී කර්මාන්තශාලා බදු දීමෙන් ලබන ආදායම සියයට 18 කින්ද, ස්ථාවර තැන්පතු මත පොළී ආදායම සියයට 213 කින්ද, වෙනත් ආදායම් සියයට 78 කින්ද, වැඩි වී තිබුණ අතර පරිපාලන වියදම් සියයට 35 කින් අඩු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 1.6: 1 ක අගයක් වූ අතර පෙර වර්ෂයේ ජංගම අනුපාතය 1.35: 1 ක් ව තිබුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව ජංගම වත්කම්වල සිදු වූ සියයට 17 ක වර්ධනයට අනුලෝමව ජංගම වගකීම් සියයට 0.2 කින් සුළු වශයෙන් වර්ධනය වී තිබීම මෙම අනුපාතයෙහි වර්ධනයට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2002 / 2003 තක්සේරු වර්ෂයට අදාළව ගෙවියයුතු රු. 4,545,276 ක රඳවා ගැනීම් බදු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟවෙමි. | හිඟ හිටි රඳවාගැනීමේ බදු නිරවුල් කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ආ) | අරමුදල විසින් ක්‍රියාත්මක කරන හොරණ පොහොර ගබඩාව හා රයිගම් කෝරලය කම්හල පිහිටි ඉඩම්වල අයිතිය , දැනට අදාළ ප්‍රදේශවල ප්‍රාදේශීය ලේකම් යටතේද ඇල්පිටිය, හිනිදුම, හා පස්සර යන කම්හල් පිහිටි ඉඩම්වල අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේද පවතින නමුත් ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව අරමුදලට පවරා ගැනීමකින් තොරව ගොඩනැගිලි හා කර්මාන්තශාලා ඉදිකර තිබුණි. | එකඟවෙමි. ඉඩම් නීත්‍යානුකූලව පවරාගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | ඉඩම් අයිතිය පවරාගැනීමට අදාළව කඩිනම් පියවර ගත යුතුය. |